# ශ්‍රී ලංකා දුම්රිය සේවය

## ලංසු ආරාධනය

## PROCUREMENT FOR THE SUPPLY OF 02 NOS. OF CENTER LATHE MACHINES

## SRS/F. 8031

1. ශ්‍රී ලංකා දුම්රිය සේවය, දුම්රිය මූලස්ථානය, තැ.පෙ. 355, කොළඹ ශ්‍රී ලංකාව වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (ප්‍රධාන) සභාපති විසින් ශ්‍රී ලංකා දුම්රිය සේවය වෙත Supply of 02 Nos. of Center Lathe Machine යෝග්‍යතාපූර්ණ සුදුසුකම් ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවා සිටී. ලංසුකරුවන්ට ඇටෝර්නි බලය සහිත බලයලත් පිළිගත් නියෝජිතයෙකු හරහා තම ලංසු ඉදිරිපත් කළ හැක.

2 ලංසු කැඳවීම **ජාත්‍යන්තර තරගකාරී ලංසු පටිපාටිය (ICB)** අනුව සිදු කෙරෙනු ඇත.

3 උනන්දුවක් දක්වන සුදුසුකම්ලත් ලංසුකරුවන්ට **පෙ.ව.9.00 සිට ප.ව.3.00 දක්වා** කාලය තුළ පහත දක්වා ඇති ලිපිනයෙන් ලංසු ලේඛන පරීක්ෂා කිරීමට සහ වැඩි දුර තොරතුරු ලබා ගැනීමට හැකි ය.

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදනය),**
**දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව,**
**ඕල්කට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව.**
**දුරකථන අංක : + 94 (11) 2438078 හෝ + 94(11) 4600202**
**ෆැක්ස් අංකය : + 94 (11) 2432044**
**ඊ මේල් : srs.slr@gmail.com, tender1@railway.gov.lk**
**වෙබ් අඩවිය : www.railway.gov.lk**

4 ලංසුකරුවා ඉහත අයිතම සැපයීමේ හැකියාව සනාථ කරන සාක්ෂි සහ වාර්තා ඉදිරිපත් කළ යුතු ය.

අ) නිෂ්පාදකයන්ට ඉහත අයිතමය නිෂ්පාදනය කිරීමේ වසර 15 ක පළපුරුද්දක් තිබිය යුතු ය.

ආ) ප්‍රසම්පාදනය පිරිනැමීම සඳහා ඉහත අවශ්‍යතා සනාථ කිරීමට, අවම වශයෙන් වසර 15 ක ඉතිහාසයක් සහිතව ඒකක 200කට වැඩි ගණනක් සැපයීමේ පෙර වාර්තා සහ අවසන් පරිශීලක වාර්තා 20 ක් ඉදිරිපත් කළ යුතු වේ.

ඇ) ලංසුකරුවා නිෂ්පාදකයා නොවන්නේ නම්, අවශ්‍ය වන අවස්ථාවන්වලදී කොටස් සහ අවශ්‍ය සියලුම තාක්ෂණික සේවාවන් සැපයීමට නිෂ්පාදකයා බැඳී සිටින බව පෙන්වන සහ ලංසුකරුවා සහ නිෂ්පාදකයා විසින් අත්සන් තබන ලද ගිවිසුමක් ලංසුකරුවා විසින් ඉදිරිපත් කළ යුතු ය.

ඈ) Lathe Machine නිෂ්පාදනය සඳහා වන වලංගු ISO 9001:2008 සහතිකයක් නිෂ්පාදකයා විසින් සැපයිය යුතු ය.

ඉ) නිෂ්පාදකයා ලංසුව සමග RoHS අනුකූලතා සහතිකය, යන්ත්‍ර සූත්‍ර විධාන අනුකූලතාව (2006/42/EC) සහ CE සහතිකය සැපයිය යුතු ය.

ඊ) වසර දෙකක (02)ක කාලයක් ඇතුලත වෙනත් රටකට අවම වශයෙන් Lathe Machine 10ක් අපනයනය කළ බවට පෙන්වන වාර්තා ඉදිරිපත් කළ යුතු ය.

උ) ලංසුකරුවා නිෂ්පාදකයා නොවන්නේ නම්, අවශ්‍ය වන අවස්ථාවන්වලදී කොටස් සහ අවශ්‍ය සියලුම තාක්ෂණික සේවාවන් සැපයීමට නිෂ්පාදකයා බැඳී සිටින බව පෙන්වන සහ ලංසුකරුවා සහ නිෂ්පාදකයා විසින් අත්සන් තබන ලද ගිවිසුමක් ලංසුකරුවා විසින් ඉදිරිපත් කළ යුතු ය.

ලංසුව සමග සමාගම් පැතිකඩ, පළපුරුද්ද, තත්ත්ව සහතික, මූල්‍ය හැකියාවන් සහ තාක්ෂණික කාර්ය මණ්ඩලයේ විස්තර සැපයිය යුතු ය.

5. අ. ලංසුකරුවෙකු වෙනුවෙන් හෝ සඳහා පෙනී සිටින නියෝජිතයෙකු හෝ උප නියෝජිතයෙකු, හෝ නම් කරන ලද්දෙකු ලෙස කටයුතු කරන ඕනෑම පුද්ගලයෙකු, ලංසු ඉදිරිපත් කිරීමට පෙර 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනත විසින් අවශ්‍ය කරන පරිදි ශ්‍රී ලංකාවේ පොදු කොන්ත්‍රාත් ලේකම් කාර්යාලයේ ලියාපදිංචි විය යුතු ය. මුල් ලියාපදිංචි සහතිකය ලංසුව සමග ඉදිරිපත් කළ යුතු ය. එම මුල් සහතිකය ඉදිරිපත් කිරීමට අසමත් වන ලංසුකරුවන්ගේ ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ආ. එමෙන්ම 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතට අනුව ලංසු ඉදිරිපත් කළ වහාම සහ ප්‍රසම්පාදනය පිරිනැමීමට පෙර ද ලංසුකරුවන්ට ලියාපදිංචි විය හැකි ය. අදාළ ප්‍රසම්පාදන කමිටුවට පොදු කොන්ත්‍රාත් පනත අනුව නිකුත් කළ ලියාපදිංචි සහතිකය ඉදිරිපත් කළ ලංසුකරුවෙකුට හැර වෙනයම් ලංසුකරුවෙකුට ප්‍රසම්පාදනය ප්‍රදානය නොකෙරේ.

6. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට **2024.12.05 සිට 2025.01.20 දක්වා ප.ව.3.00** තෙක් (ශ්‍රී ලංකා වේලාවෙන්) **නැවත ගෙවනු නොලබන රු.5,750/-** ක් මාරු කළ හැකි ව්‍යවහාර මුදල් වර්ගයකින් එයට සමාන ප්‍රසම්පාදන ගාස්තුවක් ගෙවා ලිඛිත අයදුම්පත්‍රයක් **නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ප්‍රසම්පාදන), දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව, ඕල්කොට් මාවත, කොළඹ 10** යන ලිපිනයට යොමු කිරීමෙන් හෝ විදේශයන්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලවලින් ඉංග්‍රීසි භාෂාවෙන් ඇති සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් මිල දී ගත හැකිය

7. ලංසු **2025.01.21 දින ප.ව. 2.00 හෝ ඊට පෙර** පහත ලිපිනයට භාර දිය යුතුය.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),**
**ශ්‍රී ලංකා දුම්රිය සේවය,**
**දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව,**
**ඕල්කට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව.**

**2025.01.21 ප.ව.2.00** කාමර අංක 01, තුන්වන මහල, දුම්රිය ප්‍රසම්පාදන උප දෙපාර්තමේන්තුව, තැ.පෙ.1347, ඕල්කට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව හිදී ලංසුකරුවන්ගේ බලයලත් නියෝජිතයින් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ. ප්‍රමාද වී ලැබෙන ලංසු භාරගනු නොලැබේ.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),**
**ශ්‍රී ලංකා දුම්රිය සේවය.**
**යොමු අංක SRS/F.8031**

SELACINE